## ළමයින්ගේ ලෝකයට

# මඩොල්දූව



## විජේරත්න පතිරාජ

බාහිර කථිකාචාර්ය ශ්‍රීපාලි මණ්ඩපය කොළඹ විශ්ව විද්‍යාලය

වැඩිහිටියන් විසින් ළමයින් වෙත ලබාදිය හැකියි විශිෂ්ටතම සංග්‍රහය කුමක්ද? යන්න විවිධාකාරයෙන් විමසුමට ලක්කර ඇති ප්‍රස්තුතයකි. එය ළමයකුට ගැළපෙන සකල භෞතික සම්පත් ලබා දීමක් ද? ආදරය සෙනෙහස ලබාදීමක් ද ? ලොව ඇති ඉහළම උගත්කම් ලබාදීමක් ද ? දී ලෙස ප්‍රශ්න කළ හැක්කකි. දේශපාලන දර්ශන හමුවේ වී.අයි. ලෙනින් විසින් ප්‍රකාශ කළේ ලොව ඇති හොඳම දේ ළමයෙකුට ලබාදිය යුතු බවය. මෙහිදී ද මතුවන ගැටලු නම් මෙම උසස් දෙය කවරේද යන්නයි. ඒ සමඟම එය ලබාදෙන ළමයා කවර ගනයේ කෙනෙකුදැයි ගැඹුරින් විග්‍රහ විය යුතු බව ද සැලකිල්ලට භාජනය විය යුත්තකි. මන්ද නූතන ළමයා යනු පුංචි වැඩිහිටියෙකු නොවන මිනිස් වර්ගයාගෙන් වෙනස් නොවූවත්, පුද්ගලයකු වශයෙන් සුවිශේෂී ශාරීරික හා මානසික වර්ධනයක් ද ඊට සමගාමීව




සුවිශේෂී හැඟීම් හා චර්යා රටා සමුදායක් ද ඔවුන් සතු වන හෙයිනි. 20 සියවස ළමයින්ගේ ශතවර්ෂය ලෙස විශ්ව ප්‍රකාශනයට පත් වූයේ මෙම නව ළමා චින්තන දර්ශකය සමගිනි. ඒ නිසාම ඒ වයස් කාණ්ඩ මෙන්ම පොදුවේ ළමයින් සඳහා ආරෝපණ කළ යුතු දැනුම කුසලතා හා ආකල්ප සමූහයක් ගැඹුරු විමසුමට ලක් ව ඇත. එහිදී සමස්ත ලෙස ගුණ නුවණින් සමන්විත චර්යා වර්ධිත මනා පෞරුෂයක වර්ධනය සඳහා භෞතික සංග්‍රහයෙන් ඔබ්බට ධනාත්මක ආකල්ප හා චින්තන ප්‍රබෝධය සඳහා මාහැඟි දායදයක් ලෙස ප්‍රකට වේ. ඒ සඳහා භාෂා හා සාහිත්‍ය මෙවලම් යොදා ගැනීම දියුණු මානව ඉතිහාසයේ ඈත ඉතිහාසය දක්වා විහිදී යන්නෙකි. කතන්දර කලාවේ සිට අද දක්වා විහිදී ගිය විවිධ දේශීය හා විදේශීය ළමා සාහිත්‍ය වංශයක් අප සතුව ඇත්තේ එහි ප්‍රතිඵලයක් වශයෙනි.

දරුවන් තුළ නැණ නුවණ වර්ධනය සඳහා උපදේශන කාව්‍ය ලෙස ප්‍රකාශයට පත්කර අප අධ්‍යපනයට නිර්දේශ වූ “ලෝකෝපකාරය”, “ සුභාෂිතය” හා “සිරිත් මල්දම” පිළිබඳව පසුගිය ලිපි වලින් අපි විමසා බැලුවෙමු. පැරණි සිංහල පඬිවරුන් අනාගත ජාතිය සුරක්ෂිත කිරීම සඳහා තම අත්දැකීම් ඇසුරෙන් නිර්මාණ වලට නගන ලද එම උපදේශන වටිනාකම සර්වභෞමික ය. සර්වකාලීනය. අද ළමා පරපුරට එවැනි මගපෙන්වීම් වල ඇති ඌනතාවයේ පලවිපාක වර්තමාන සමාජ වියවුල් වලින් පැහැදිලි වේ. ළමයින්ගේ ලෝකය ආලෝකමත් කිරීමට නවකතා සාහිත්‍යයෙන් ලබාදිය හැකි මාහැඟි රැකවරණය සුළුපටු නොවෙයි. නිර්මාණාත්මක චින්තනය ළමා හසුරු කුසලතා හා වින්දන ශක්ති වර්ධනය සඳහා රචිත නිර්මාණවලින් විශ්ව ළමා සාහිත්‍ය පිරී පවතී. ශ්‍රී ලංකාවේද ළමා පරපුර ආකර්ෂණය කළ නිර්මාණ රාශියකි. ඒ අතරින් අපගේ අග්‍රගන්‍ය ලේඛක මාර්ටින් වික්‍රමසිංහයන්ගේ මඩොල්දූවෙහි සාහිත්‍යමය වටිනාකම විමසා බැලීම මෙම ලිපියේ පරමාර්ථය වේ. තම මවුබිමෙන් මෙන්ම මව් බසින් බැහැරව සංක්‍රමික පිරිසක් ලෙස මෙහි ජීවත්වන සිංහල දූ දරුවන්ට සිංහල බස ස්ථාපිත කර ගැනීමටත් තම දිවියට මෙරටින් ලබාගත නොහැකි භෞතික අත්දැකීම් හා වින්දනය සාහිත්‍යමය වශයෙන් වර්ධනය කරගැනීම සඳහාත් මෙවන් නිර්මාණයකින් ලැබෙන ප්‍රතිඵලය මහඟුය. එය ළමයින්ට ළමයින්ගේ ලෝකය තුල පරිකල්පනය ඔස්සේ ජීවත්වීමට අවස්ථාවක් ලබාදීමක් වන්නේය.

කොග්ගල ප්‍රාඥයා යන අන්වර්ථ නාමයෙන් හැඳින්වෙන මහා ගත්කරු මාර්ටින් වික්‍රමසිංහයන් විසින් රචිත විවිධ දිසාවන්ට විහිදී ගිය නිර්මාණ පරාසය අද්විතීය වූවකි. ඒවා දේශීය - විදේශීය නොමඳ හමණට හා ගෞරවයට පත් වූයේ ඔහු



හෙළයේ මහා ගත්කරු බවට පත්කරමිනි. 1890 මැයි 29 දින කොග්ගල උපත ලද ඔහු කුඩා අවධියේ සිට තමා උපන් ගොවි ගැමි ධීවර පරිසරයට වශීකෘතව කළ අධ්‍යයනයන් හේතුකොටගෙන නිර්ව්‍යාජ දේශීය සාහිත්‍ය කලාවක උරුමය, ශ්‍රී ලංකාවට පමණක් නොව ජාත්‍යන්තරව ද ප්‍රචලිත කිරීමට තරම් පුණ්‍යවන්ත විය.

වයස අවුරුදු අටේදී තම පියා මිය යාමෙන් උසස් අධ්‍යාපනයක් ලැබීමට වරම් නොලත් ඔහු තම ගැමි දිවිය ජීවන තක්ෂිලාව බවට පත් කරගත් ආකාරයේ මහිමය ඔහුගේ කෘති පුරා නොඅඩුව ප්‍රතිනිර්මාණ වේ. අපේ ගම - ගම්පෙරළිය - යුගාන්තය - විරාගය - කලි යුගය - උපන්දා සිට වැනි ඔහුගේ ප්‍රධාන නවකතා අතර 1949 දී රචිත මඩොල්දූව, ළමා හා යොවුන් නවකතාවක් ලෙස එතෙර මෙතෙර සම්මභාවනාවට පත් වූ නිර්මාණයක් වේ. එහි අන්තර්ගතය ළමා ලෝකයෙහි අපූර්වත්වයකින් යුක්ත වීම ඊට පාදක විය. මඩොල්දූව විවරණය කරන චෙකොස්ලෝවැකියානු විශ්ව විද්‍යාලයේ ආචාර්ය අයි. ස්කාවේජ් මඩොල් දූවේ වීරයන් නිර්භය අධිෂ්ඨාන ඇත්තන් බවට පත් කරනු ලබන්නේ ශ්‍රම ශක්තිය විසින් බවත් ඔවුන්ගේ වැටහෙන නුවණ, නුගත්කම මැඩගෙන ජයග්‍රහණය කරන බවත් පෙන්වා දෙයි. මේ සියලු ගතිගුණාංග උපාලිගේ චරිතයෙන් විකාශනය වන බවත්, උතුරා යන ජීව ගුණය ඇති ඔහු අපූර්ව යොවුන් වීරයෙකු බවත් පෙන්වා දෙයි. මඩොල් දූවේ අන්තර්ගත මෙම අධ්‍යාපනික ගුණය හේතුකොටගෙන එය විශ්ව භාෂා නවයකට පරිවර්තනය වී ඇති අතර ශ්‍රී ලංකාවේ පමණක් දැනට එහි පිටපත් දස ලක්ෂයකට වඩා අලෙවි වී ඇති බව වාර්තාවේ. 1976 දී ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් විසින් මඩොල් දූව ළමා චිත්‍රපටයක් ලෙස නිෂ්පාදනය කෙරිනි. මාර්ටින් වික්‍රමසිංහයන්ගේ උසස් භාෂා සාහිත්‍යය සේවයට ගරු කරන මෙරට සෑම විශ්වවිද්‍යාලයකින් ම ඔහුට ආචාර්ය උපාධි පිරිනැමුණු බව ද සඳහන් කළ යුත්තකි.

මාර්ටින් වික්‍රමසිංහ ගේ චරිතය සිංහල රටේ උපන් සෑම දරුවෙකුගේම අත්දැකීමක් එක්තැන් වුණ චරිතයක් ලෙස හැඳින්විය හැක. කුඩා කාල පටන් තම උපන් පරිසරයෙන් ආත්මානුවේශයක් ලෙස සැලකුනු ගවේෂණශීලීත්වය හා කුතුහලයෙන් නිවසේ තිබූ හුදකලාබවත් හේතු කොටගෙන ගොඩනැගුණු සක්‍රීය බවත් ඔහුව අද්විතීය නිර්මාණ කරුවෙකු බවට පත් වීමට හේතු වූ බව පෙනී යයි. පරිච්ඡේද දහයක් ඔස්සේ උපාලි චරිතය ඔස්සේ ගොඩනඟන තමා සතු වූ විසේකාර කෙළිසෙල්ලම් බව අදටත් නිර්මාණශීලි ළමා පරපුරට ආශිර්වාදයක් වනු ඇත. එය 1719 ඩැනියෙල් ඩිපෝ විසින් රචිත රොබින්සන් ගේ කතාව ආවර්ජනය කරවන්නකි.

මවගේ හදිසි මරණයෙන් හුදකලා වන උපාලි ගිනිවැල්ලේ වඩා අසහනයට පත් වන්නේ ඊට වසරකට පමණ පසු කැන්දාගෙන එන කුඩම්මාගේ රැකවරණය යටතේදීය. දැඩි වෙනස්කමක් සිතාකළත් ඇයගේ සකසුරුවම්කම මෙන්ම ඊට වසරකට පසු පවුලට අලුත් පුතෙකු එකතු වීමෙන් තමා දඟකාර වූ බව ඔහුට මතකය. ක්‍රමයෙන් පාසල් යාමට වඩා යහළුවන්



සමග සෙල්ලම් කිරීමට ඔහු ඉමහත් ලෙස ඇලුම් කළේය. එහිදී ළමයින් සමග පොරබැදීම, ඇල ගංගාවල නෑම ආදියට තාත්තාගෙන් දඬුවම් ලැබීමෙන් ඔහු මෙල්ල කළ නොහැකි විය. මොහුට නිවසේ හිතකර වූයේ වැඩකාරකමට සිටි දුර නෑකමක් තිබූ ජිනපාල පමණි. උපාලිට වඩා වසර තුනකින් පමණ වැඩිමල් ඔහුව අමතන ලද්දේ ජින්නා යනුවෙනි. ඔහු ද සෙල්ලමට ලොල් වූයේ තම වැඩ කොටස් නිමාකොට මග බලා සිටියේ උපාලි පාසල් ඇරී එනතුරුය.

පාලු අම්බලන්වත්ත කුරුම්බා කඩා කන සෙල්ලමේදී නායකයා වූයේ ජින්නාය. සෙල්ලම්වලදී අවට කැලෑරොද, වැලිතලා, දියකඩිති ඔවුන්ගේ කුතුහලය මුවහත් කළේය. කැලේ රොදෙහි තිබූ පොකුණට නාන්නට හා වතුර ගෙන යාමට එන පිරිස් ද ඔවුන්ගේ සෙල්ලම් වලට උදව් කළහ. එක් එක් දිනවල ඔවුනගේ සෙල්ලම් මාතෘකා වෙනස් වෙයි. පල්හොර කණ්ඩායම ලෙස කෙරෙන රංගනය ඒ අතර ආකර්ශනීය වූවකි. උපාලි බොහෝවිට කණ්ඩායමේ නායකයා විය. ජින්නට අමතරව අවටින් එක් වූ අනෙකුන් නායකත්වයට ගරු කිරීම ඊට හේතු විය. අණ නොපිළිපදින සොරුන්ට නායකයා දෙන දඬුවම් ප්‍රබල විය. ඔවුන් මීට පෙර අසා තිබූ සොරුන්ගේ චරිත නිරූපණය බොහෝවිට සිදුවිණි. එහිදී වෙස් මාරුකර ගැනීම, චරිතවලට ආවේශ වීම, සටන් ක්‍රම භාවිතය, දරදඬු වචන හා ක්‍රියා හුවමාරු ආදිය කුතුහලය ඇති කළේය. වැඩිහිටි චරිත පවා බය කිරීමට අවස්ථාව යොදා ගැණින. මුර කරුගේ ගේ බිඳීම එවැනි අවස්ථාවකි. පිරිස හඳුනා ගැනීමට නොහැකි වූ නිසාත් තදබල ලෙස හිංසන ක්‍රියා සිදු නොවීම නිසාත් අපරාධ ගනයට ඒවා නොවැටුණි.

දිනක කැලේට වැදුණු පිරිස වැදි වෙස් ගැනීම සෙල්ලම් ලෝකයෙහි උච්ච අවස්ථාවක් විය. පිරිස වැද්දන් ලෙස වෙස් මාරු කර ගෙන කෝටු වලින් තනා ගත් දුනු ඊතල හා කැටපෝල් මඟින් කළ විදීම් වලින් වතුර ගෙන යාමට පැමිණි දැරියන්ට තුවාල වීම, කළගෙඩි බිඳ දැමීම ආදිය වැඩිහිටි විවේචනයන්ට ලක් වුණි. එම සිදුවීම් සම්බන්ධව ගොඩනැගුණු ඕපාදූප දරුණු වීම ඊට හේතු විය. ඔපිසර රාළහාමිගේ පුතා වූ උපාලි පුංචි මහත්තයා ප්‍රමුඛ ගැටවරයන්ගේ දඟකාරකම් ඇතැමුන් අනුකම්පාවට ලක් වුවත් තාත්තාගේ කෝටු පාරවල් වලින් බේරීමට උපාලිට නොහැකි විය. මේ අතර තාත්තාගේ කේන්තිය වැඩි වූයේ ඉස්කෝලේ මහත්තයා පැමිණ උපාලි සතියකට දවසක් පමණක් පාසල් නොයන බවට වාර්තා කිරීමෙනි. පාසල් යාම මගහැර කොල්ලන් සමඟ ඔරුපැදීමට ගඟට යාම ආදියට තරවටු ලැබුණත් උපාලිට අවශ්‍ය වූයේ ඇඟට දැනෙන දඟවැඩ කිරීමටය. එහෙයින් ගමේ සිටියොත් බේරා ගැනීමට නොහැකි තත්ත්වයකට පත්වේ යැයි සිතූ තාත්තා උපාලිව වැලිකන්දේ සිටි තම හිතවත් ඉස්කෝලේ මහත්තයෙකුගේ ගෙදර නැවැත්වීමට කටයුතු කිරීම උපාලිගේ ළමා අවධියේ හැරවුම් ලක්ෂය විය. එහෙත් එය තමා වීරයෙකු ලෙස වැජඹුණු ජින්නා ප්‍රමුඛ කල්ලියෙන් වෙන්වීම ඉවසුම් නොදෙන්නක් විය.

ධර්මසිංහ ගුරු මහතාගේ නිවසේ උපාලිගේ පාළුවට පිළිසරණ වූයේ එහි සිටි අට අවුරුද්දක් පමණ වූ ගුණදාස නම් පිරිමි ළමයත් හය හැවිරිදි සෝමලතා නම් ගැහැණු ළමයාත් පමණි. තම උපාලි ඉස්කෝලේ හාමිනේ දුටුවේ සිනාසීම පාපයක් යැයි සිතූ කෙනෙකු ලෙසිනි. අලුත් පාසලේ ළමයින් උපාලි සමඟ මිත්‍ර වුවත් එහිදී ද ඉගෙනුමට වඩා සෙල්ලමට හිත ගිය නිසා, නිතර ලැබෙන අවවාද අනුශාසනා ඔහුට කන්දොස්කිරියාවක් සේ දැනුණි. ගුණදස හා සෝමලතා ද ඔහුගේ ගොඩට වැටී තිබීම සැනසීමට හේතුවක් විය. ඔවුන් හතර දෙනා එක් වූ විට අපූරු ප්‍රශ්න හා ක්‍රයාකාරකම් වලින් යුක්ත ළමා ලෝකයක් ගොඩ නැගුණි. ඒවා නිම වන්නේ තරවටු වලිනි. තමාගේ ළමයි දෙන්නා හදා ගැනීමේ දී උපාලි අභියෝගයක් විය. එවැනි එක් අවස්ථාවකදී උපාලි ගුරු මහතා ගේ ගුටි වලින් බේරීම සඳහා නිවසින් පැන ගත්තේය. ඔංචිලි බැඳීමට එහි නෝනාගේ සාරි යොදාගෙන ඉරා දැමීම වරදක් බව ඔහුට දැනුනේ පසුවය. උපාලි ගෙදරින් පැන කෙලින්ම ගියේ තමා ආශා කළේ මුහුදු වෙරළටය. රාත්‍රියේ හුදකලා වූ ඔහු එහි තිබු පාලු ඔරුවක නිදාගත්තේය. පසුදා උදෙන්ම පැමිණි ඔරු කාරයෙක් සමඟ මිත්‍රවී ඔවුන් සමග දියඹට යාමට අවස්ථාවක් උදා වීම තමාගේ සිහිනයක් උදාවීමක් විය. එය ඈත මුහුදේ බල මාළු ඇල්ලීමේ අත්දැකීමක් විය. පසුදා ඔරු කරුවන් විසින් උපාලිව ගුරු දෙපොළට භාරදුන්නේ කාගෙත් සිත් වලට සැනසුම ළඟා කරගනිමිනි. උපාලිට දඬුවම් නොලැබුණේ ගුරු යුවළ ද තම දුර්වලකම් තේරුම් ගත් හෙයිනි. එහෙත් පසුවදාම තාත්තා ගෙන්වා උපාලි භාරදීමට කටයුතු කිරීම තරවටුවක් විය. මෙහි ගතකල අවුරුද්දක පමණ කාලය තුළ හරිහමන් ඉගෙනුමක් නොවීම ගැටලුවක් වුවත්, තව ටික කලක් මෙහිම ඔහුව නතර කිරීම තාත්තාගේ තීරණය විය. උපාලි වෙනුවෙන් මුදල් ලැබෙන නිසා ගුරු යුවළ ද එය ප්‍රතික්ෂේප නොකිරීම හිසරදයක් වූයේ ළඟ එන සිංහල අවුරුද්දට ගමට යාමට නොලැබෙන හෙයිනි. අවුරුදු නිවාඩුවෙන් පසු ගමට යාමට අවස්ථාවක් උදා වූයේ ධර්මසිංහ මහතා දික්වැල්ලේ වෙනත් පාසලකට මාරු වීම ලැබීමත් නිසා ය.

නැවත ගමේ පාසලට ඇතුළත් කිරීමෙන් පසුව උපාලි තම පිරිවර වූ ජින්නා ප්‍රමුඛ මිතුරන් හා එක්වීමට අවස්ථාවක් උදාවීම සතුටට හේතු වුවත්, කුඩම්මාට නම් ඔහුගේ පැමිණීම හිසරදයක් විය. ගමේ කොලු රංචුව සමග කල්ලි ගැසීමට යාම ඊට ප්‍රධාන හේතුවක් විය. මේ දිනවල ගමේ සිටි සුරංචියා වැනි අද්භූත සටකපට හොරුන් ගැන තොරතුරු සෙවීමට උපාලි කණ්ඩායම ගවේෂණශීලී විය. මිනිසුන් රවටා මගඩි නැටුම් නැටූමකට ටිකට්ස් විකුණා මුදල් එකතුකර ගමෙන් පැන ගත් ආකාරය විමසීම වැනි අත්දැකීම් විය. එවැනි චරිත වීරයන් ලෙස සලකා ඔවුන්ගේ මගඩි වලට අසුවීමෙන් පලවිපාක ඔවුන් ඉගෙන ගත්තේ තක්කඩි සුරංචියා පැනගිය පසුය. ගමේ ඉගෙනීම පමණක් නොව ඒකාකාර ජීවිතය ඔහුට හිතකර නොවිය. දඟකාරකම් පහකර ගැනීමට අවස්ථාවක් නොවීම ඊට හේතුව විය. පාසල් නිවාඩු කාලය තුළ ගමේ නපුරෙකු ලෙස සැලකුණු උපාසක අප්පුගේ කොටුකළ කජු වගාවට රිංගා හොරෙන් කජු කැඩීම සංවිධානය කරන්නේ මේ අතරතුරදීය. උපාසක ආප්පු ගමනක් ගිය දිනක කජු කඩමින් සිටි අතර පැමිණි උපාසකට ජින්නා අසුවීමත් ඔහුව බේරාගැනීමට උපාසක අප්පු පෙරලා අත පය බැඳ දමා පිරිස පැණ යාමෙන් ගම දෙවනත් කළ සිද්ධියක් ලෙස පැතිරිණි. එය උපාසකගේ ගේ දොරකඩ කළ මහා සොරකමක් ලෙසත්, හඳුනා ගත් ප්‍රධාන සොරුන් දෙදෙනා උපාලි සහ ජින්නා බවට පත් විය. තාත්තා ගෙන් ලද වේවැල් පහරවල් වලට වඩා බිය වූයේ සොරුන් ඇල්ලීමට පොලිසියෙන් එන බවට ආරංචි වූ නිසාය. සිද්ධිය අවසාන ප්‍රතිඵලය වූයේ රහසින් කතා කරගත් පරිදි උපාලි හා ජින්නා තම ඇඳුම් ටිකත් අකුලාගෙන ගෙදරින් පැන යාම ය.

නිවසින් පැන යාම මඩොල්දූවේ උපාලි සටහන් කරන්නේ මෙසේය. “නොනිඳ සිටි අප මැදියම් රැයද ඉකුත් වූ පසුව අපේ ඇඳුම් පොඩි සමඟ ගෙයින් එළියට බැස්සේ හිස හැරුනු අතක් බලාගෙන යන අදහසිනි. ගාල්ල බලා යන කරත්ත දෙකක් අපට හමුවිය. අපි ඒ හිස් කරත්ත පස්සේ යාමට හිතාගත පසුදා ගමෙන් මයිල විස්සක් පමණ ඈත් වූ අප පාර අයිනේ අම්බලමක පිල්කඩ උඩ වාඩිවී කල්පනා කළේ මීළඟට කළ යුතු කාර්ය ගැනය. ඒ ළඟ පෙනෙන කොප්පරා මඩුවෙන් රස්සාවක් ඉල්ලීමට තීරණය කරන්නේ ඉන් පසුවය. දෙමසක් එහි වැඩ කලත් සෑහීමකට පත් නොවූ ඔවුන් එයින් අස් වී ගොස් ඈත ගම්බද හේන් ගොවියකු වූ පොඩි ගමරාල සමග එක්වීම මෙම කතා පුවතේ උච්චතම හැරවුම් ලක්ෂය ලෙස හැඳින්විය හැක.

පොඩි ගමරාළ ද සමග හේන් ගොවිතැනට හුරු වීම,හේන කෙළවර ගඟ මැද තිබූ මඩොල්දූව නම් දූපත තරණය කිරීම, ප්‍රමුඛ ත්‍රාසජනක සිදුවීම්

46 වන පිටට